# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 1912/2 - 2015 අප්‍රේල් මස 27 වැනි සඳුදා - 2015.04.27**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්.ඩී.බී 5/2011.

**2008 අංක 40 දරන ජාතික මංමාවත් පනත**

2008 අංක 40 දරන ජාතික මංමාවත් පනතේ 13 වන සහ 14 වන වගන්ති සමග කියවිය යුතු එකී පනතේ 89(2)(ඇ) වන වගන්තිය යටතේ මහා මාර්ග සහ ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යවරයා විසින් සාදන ලද නියෝග.

කබීර් හෂීම්,
මහා මාර්ග සහ ආයෝජන ප්‍රවර්ධන අමාත්‍ය.

2015 අප්‍රේල් මස 27 වන දින,
කොළඹ දීය.

නියෝග

1. මෙම නියෝග 2015 අංක 1 දරන ජාතික මංමාවත් (කොළඹ - කටුනායක ගාස්තු ගෙවිය යුතු ජාතික මහා මාර්ග) නියෝග යනුවෙන් හඳුන්වනු ලැබේ.

2. මෙම නියෝග 2008 අංක 40 දරන ජාතික මංමාවත් පනතේ 11 වන වගන්තිය යටතේ සාදන ලද 2013 ඔක්තෝම්බර් 12 වන දින සහ අංක 1831/31 දරන අති විශෙෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියමය මගින් ප්‍රකාශිත "කොළඹ - කටුනායක ගාස්තු ගෙවිය යුතු ජාතික මහා මාර්ගය" සම්බන්ධයෙන් අදාළ කර ගත යුතුය.

3. (1) ඉහත කී ගාස්තු ගෙවිය යුතු ජාතික මහා මාර්ගයේ භාවිත කරන සෑම වාහනයක රියදුරෙකුගෙන්ම ඒ මහා මාර්ගය එම රියදුරු විසින් භාවිත කිරීම සම්බන්ධයෙන් මෙම නියෝග වල උපලේඛනයේ "අ" කොටසේ නිශ්චිතව දක්වා ඇති පරිදි ගාස්තු අය කර ගනු ලැබිය යුතුය.

(2) ජාතික මහා මාර්ගයේ සම්පූර්ණ දුර ප්‍රමාණය හෝ ඉන් කොටසක් සම්බන්ධයෙන් එම ගාස්තුව අයකර ගනු ලැබිය යුතුය.

(3) විවිධ වර්ග වලට අයත් වාහන වලට විවිධ ගාස්තු නියම කරනු ලැබිය යුතුය.

(4) (1) වන ඡේදයේ සඳහන් ගාස්තුව -

(අ) අත්පිට මුදලින්; හෝ

(ආ) වාහනයට සම්බන්ධ කර ඇති (මෙහි මින්මතු "ඊ-ටැග්" (E-tag) යනුවෙන් හඳුන්වනු ලබන) උපාංගයක් මගින් ඉලෙක්ට්‍රොනික ආකාරයෙන්

ගෙවනු ලැබිය යුතු ය.


1A - PG 2444 — 256 (2015/04)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

4. (1) (මෙහි මින්මතු "ඊ-ටැග් භාවිතකරන්නා" (E-tag user) යනුවෙන් හඳුන්වනු ලබන) ගෙවීම් ඉලෙක්ට්‍රොනික ආකාරයෙන් කිරීමට කැමැත්ත දක්වන යම් වාහනයක අයිතිකරුවකු හෝ රියදුරකු විසින් (මෙහි මින්මතු "අධිකාරිය" යනුවෙන් හඳුන්වනු ලබන) 1981 අංක 73 දරන මාර්ග සංවර්ධන අධිකාරිය පනත යටතේ පිහිටුවා ඇති මාර්ග සංවර්ධන අධිකාරිය යටතේ ලියාපදිංචි විය යුතු අතර අධිකාරියේ පාරිභෝගික සේවා මධ්‍යස්ථානයෙහි ඇති (මෙහි මින්මතු" ඊටීසීඑස් ගිණුම"(ETCS ගිණුම) යනුවෙන් සඳහන් කරනු ලබන) ඉලෙක්ට්‍රොනික ආකාරයෙන් ගාස්තු එකතු කිරීමේ ගිණුමක් විවෘතකරනු ලැබිය යුතු ය.

(2) ඊ-ටැග් භාවිත කරන්නකු (E-tag user) ලෙස ලියාපදිංචි වීම සඳහා වූ සෑම ඉල්ලුම් පත්‍රයක්ම අධිකාරියේ පාරිභෝගික සේවා මධ්‍යස්ථානය වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

(3) ලියාපදිංචිය සඳහා ඉල්ලුම් පත්‍රයක් ලැබීමෙන් පසුව ඊටීසීඑස් ගිණුමට (ETCS ගිණුමට) අදාළ තොරතුරුද ඇතුළුව ඉල්ලුම් පත්‍රයේ සපයා ඇති තොරතුරු පිළිබඳ සෑහීමකට පත්වී මෙන් පසුව අධිකාරිය විසින් එම තැනැත්තා ඊ-ටැග් භාවිතකරුවකු (E-tag user) වශයෙන් ලියාපදිංචි කර මෙම නියෝගවල කාර්ය සඳහා එම තැනැත්තා වෙත ඊ-ටැග් (E-tag) උපාංගයක් නිකුත් කරනු ලැබිය හැකි ය.

(4) සෑම ඊ-ටැග් භාවිතකරුවකු (E-tag user) විසින් එම ගිවිසු මේ නිශ්චිතව දක්වා ඇති නියම හා කොන්දේසි වලට යටත්ව (මෙහි මින්මතු "ඊටීසීඑස් පාරිභෝගික ගිවිසුම"(ETCS පාරිභෝගික ගිවිසුම) යනුවෙන් සඳහන් කරනු ලබන) ඉලෙක්ට්‍රොනික ආකාරයෙන් ගාස්තු එකතු කිරීමේ පාරිභෝගික ගිවිසුමකට ඇතුළත් විය යුතු ය.

(5) නිකුත් කරන ලද සෑම ඊ-ටැග් (E-tag) උපාංගයක්ම වාහනයේ ඉදිරිපස වීදුරුව මත සවිකර තිබිය යුතු ය.

(6) (මෙහි මින්මතු "ඊටීසී මංතීරුව"(ETC මංතීරුව) යනුවෙන් සඳහන් කරනු ලබන) ගාස්තු ඉලෙක්ට්‍රොනික ආකාරයෙන් එකතු කිරීමේ මංතීරුවක් භාවිතා කරන සෑම අවස්ථාවක දීම අදාළ ගාස්තු ගෙවීමට හැකිවන පරිදි ඊටීසීඑස් ගිණුමේ (ETCS ගිණුමේ) ප්‍රමාණවත් හර ශේෂයක් පවත්වාගෙන යෑම සෑම ඊ-ටැග් භාවිත කරුවකුගේම (E-tag user) වගකීම විය යුතු ය.

(7) ඊටීසීඑස් ගිණුමේ (ETCS ගිණුමේ) ප්‍රමාණවත් මුදලක් නොපවතින අවස්ථාවක දී, ඊ-ටැග් භාවිතකරු (E-tag user) විසින් එම ගිණුමේ අතිරේකය පිරවිය හැකි අතර එම පිරවීමේ ක්‍රියාවලිය සම්පූර්ණ වීම සඳහා පැය එකකට නොඅඩු කාලයක් ගත විය හැකි අතර එම කාලය අවසන් වන තෙක් ඊ-ටැග් භාවිතකරුවකුට (E-tag user) ඊටීසී මංතීරුව (ETC මංතීරුව) භාවිත කිරීමට නොහැකි විය යුතු ය.

(8) ඊ-ටැග් (E-tag) උපාංගය නිසි ක්‍රියාකාරී තත්වයෙන් පවතින බවට සෑම ඊ-ටැග් භාවිතකරුවකු ම (E-tag user) සහතික විය යුතු අතර එම ඊ-ටැග් (E-tag) උපාංගයට යම් හානියක් සිදු වී හෝ එම ඊ-ටැග් උපාංගය (E-tag) නැති වී හෝ ඇති අවස්ථාවක දී ඒ පිළිබඳ අධිකාරිය වෙත දැනුම් දිය යුතු ය.

5. (1) ගාස්තු ගෙවීම සඳහා ප්‍රමාණවත් මුදල් සහිතව යම් ඊ-ටැග් භාවිතකරුවකු (E-tag user) යම්නම් කරන ලද ස්ථානයකින් හැරයම් අන්තර් හුවමාරුවකින් ගාස්තු ගෙවීමේ ජාතික මහා මාර්ගයකට ප්‍රවේශ වන අවස්ථාවක දී, එම ඊ-ටැග් භාවිතකරුවකුට (E-tag user) එම අන්තර් හුවමාරුවේ ඊටීසී මංතීරුව (ETC මංතීරුව) ඔස්සේ ඉදිරියට ගමන් කිරීමට අවසර ලබාදිය යුතුය.

(2) ඊ-ටැග් (E-tag) උපාංගයක් සවිකර ඇති යම් වාහනයක් ඊටීසී මංතීරුව (ETC මංතීරුව) භාවිතා කරන අවස්ථාවක දී, ගාස්තු ස්වයංක්‍රීයව ඊටීසීඑස් ගිණුමට (ETCS ගිණුමට) එරෙහිව හර කරනු ලැබිය යුතු අතර ඊ-ටැග් භාවිතකරු (E-tag user) විසින් එම ගිණුම භාවිතා කිරීම සම්බන්ධයෙන් අධිකාරියේ පාරිභෝගික සේවා මධ්‍යස්ථානයෙන් ගිණුම් ප්‍රකාශනයක් ලබා ගත හැකි වන්නේ ය.

(3) ගාස්තු ගෙවීම සඳහා ඊ-ටැග් භාවිතකරුට (E-tag user) ප්‍රමාණවත් මුදල් නොපවතින අවස්ථාවක දී ඊ-ටැග් භාවිත කරු (E-tag user) විසින් ස්වකීය වාහනය ඊටීසී මංතීරුවේ (ETC මංතීරුව) සිට (මෙහි මින්මතු එම් යූසී මංතීරුව (MUC මංතීරුව) යනුවෙන් සඳහන් කරනු ලබන) අත්පිට මුදලින් ගාස්තු එකතු කරන මංතීරුව වෙත හරවනු ලැබිය යුතු ය. එකී ගාස්තු ගෙවීම සම්බන්ධයෙන් 6 වන නියෝගයේ සඳහන් විධිවිධාන අදාළ විය යුතු ය.

6. (1) යම් නම් කරන ලද ස්ථානයකින් හැර යම් අන්තර් හුවමාරුවකින් ගාස්තු ගෙවීමේ මහා මාර්ගයට ප්‍රවේශ වන ඊ-ටැග් (E-tag) උපාංගයක් සවිකර නොමැති වාහනයක රියදුරකු විසින් එම්යූසී මංතීරුවේ (MUC මංතීරුවේ) ගමන් කිරීමට අවසර ලබා දීමට ප්‍රථමයෙන් ඒ අන්තර් හුවමාරුවේ සේවයේ යෙදී සිටින අයකැමිගෙන් ප්‍රවේශ පත්‍රයක් ලබා ගත යුතු ය.

(2) මෙම නියෝගයේ (1) වන ඡේදයේ සඳහන් යම් වාහනයක රියදුරකු විසින්, ගාස්තු ගෙවීමේ ජාතික මහා මාර්ගයෙන් පිටව යෑමේ අරමුණ සඳහා ඒ රියදුරා විසින් පසු කර යායුතු අන්තර් හුවමාරුවේ හෝ නම් කරන ලද ස්ථානයේ ගාස්තු ගෙවීමේ ස්ථානයකට පැමිණි විට,-

(i) ඔහුඅන්තර් හුවමාරුවෙන් ගාස්තු ගෙවිය යුතු ජාතික මහා මාර්ගයට ප්‍රවේශවීමේ දී ලබාගත් ප්‍රවේශ පත්‍රය එම්යූසී මංතීරුවේ (MUC මංතීරුවේ) අයකැමි යටතට පත්කළ යුතුය ; හෝ

(ii) තමා ගාස්තු ගෙවිය යුතු ජාතික මහා මාර්ගයට ප්‍රවේශ වූ නම් කරන ලද ස්ථානය අයකැමි වෙත සඳහන් කළ යුතුය.

(3) එම්යූසී මංතීරුව (MUC මංතීරුව) භාවිතා කරන වාහන සඳහා ගෙවිය යුතු ගාස්තුව අයකැමි විසින් රියදුරු වෙත දැනුම් දිය යුතු වන අතර ඒ අනුව අන්තර් හුවමාරුවෙන් හෝ නම් කරන ලද ස්ථානයෙන් පිටවී යෑමට අවසර ලබා දීමට ප්‍රථමයෙන් ඒ මුදල රියදුරු විසින් ගෙවිය යුතු වන අතර අයකැමි විසින් ඒ ගෙවීම වෙනුවෙන් ලදු පතක් නිකුත් කළ යුතු ය.

7. (1) 6(1) වන නියෝගයේ සඳහන් කරන ලද ප්‍රවේශ පත්‍රයක් ලබා ගෙන ඇති සෑම රියදුරකුම එම ගාස්තු ගෙවිය යුතු ජාතික මහා මාර්ගයෙන් පිටවීම සඳහා ඔහු අපේක්ෂා කරන අන්තර් හුවමාරුවේ හෝ නම් කරන ලද ස්ථානයේ ගාස්තු ගෙවීමේ ස්ථානයට ලඟා වන තෙක් එම ප්‍රවේශ පත්‍රය ඔහුගේ සන්තකයේ සුරක්ෂිතව තබා ගත යුතුය.

(2) (අ) රියදුරු විසින් ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් කිරීමට නොහැකි වන අවස්ථාවක දී ; හෝ

(ආ) ගාස්තු ගෙවිය යුතු ජාතික මහා මාර්ගයට ප්‍රවේශ වූ ස්ථානය සඳහන් කිරීමට රියදුරුට නොහැකි වූ අවස්ථාවකදී,

එම රියදුරු විසින් ගාස්තු ගෙවිය යුතු ජාතික මහා මාර්ගයේ සම්පූර්ණ දුර ප්‍රමාණය ම ගමන්කර ඇති අයකු ලෙස සලකනු ලැබිය යුතු අතර ඒ අනුව ගාස්තු ගෙවිය යුතු ජාතික මහා මාර්ගයේ සම්පූර්ණ දුර ප්‍රමාණය සඳහා ගාස්තු අයකරගනු ලැබිය යුතු ය.

8. (1) අධිකාරිය විසින්, මෙම නියෝගවල විධිවිධාන ක්‍රියාත්මක කිරීමේ කාර්යය සඳහා, එකී ගාස්තු ගෙවිය යුතු ජාතික මහා මාර්ගය දිගේ අවශ්‍ය කරන ස්ථානවල ප්‍රමාණවත් තරම් ගේට්ටු සංඛ්‍යාවක් සවිකර ඇති බවට සහතික විය යුතුය.

(2) ගාස්තු ගෙවිය යුතු ජාතික මහා මාර්ගය දිගේ එසේ සවි කරන ලද ගේට්ටුවල අයිතිය, පාලනය සහ නඩත්තුව අධිකාරිය සතු වන අතර එක් එක් ගේට්ටුව අය කැමියකු විසින් හසුරුවනු ලැබිය යුතුය.

(3) (2) වන ඡේදයෙන් නියම කර ඇති පරිදි පිහිටුවා ඇති සෑම ගේට්ටුවකදීම ගාස්තු ගෙවිය යුතු ජාතික මහා මාර්ගයක් භාවිත කරන සෑම රියදුරකුගෙන්ම මෙම නියෝග වල උපලේඛනයේ "අ" කොටසේ නිශ්චිතව දක්වා ඇති පරිදි භාවිත කිරීමේ ගාස්තු වශයෙන් යම් මුදලක් එකතු කර ගැනීම සඳහා එම් යූසී මංතීරුවට (MUC මංතීරුවට) අදාළ අයකැමි වගකිව යුතුයඃ

එසේවුවද, මෙම නියෝගවල උපලේඛනයේ"ආ" කොටසේ නිශ්චිතවම සඳහන්කර ඇති ගාස්තු ගෙවීමෙන් බැහැර කළ යුතු වර්ගයක වාහනයක් පදවන රියදුරකු වෙත මෙම නියෝග වල විධිවිධානයන් අදාළ නොවිය යුතුය.

9. අයකැමි විසින්, නිශ්චිතව සඳහන් කර ඇති යම් වේලාවකදී දිනය තුළ එකතු කළ ගාස්තු අධිකාරිය විසින් තත්කාර්යය සඳහා බලය දෙන ලද නිලධරයකු වෙත භාර දිය යුතු අතර ඒ මුදල සම්බන්ධයෙන් කුවිතාන්සියක් ලබා ගත යුතුය.

10. ගාස්තු ලෙස එසේ එකතු කර ගත් මුදල් අධිකාරියේ අරමුදලට බැර කරනු ලැබිය යුතු අතර, මෙම නියෝග අදාළ වන ගාස්තු ගෙවිය යුතු ජාතික මහා මාර්ගය සංවර්ධනය කර පවත්වා ගෙන යාමේ කාර්ය සඳහා එම මුදල් භාවිත කරනු ලැබිය යුතුය.

11. මෙම නියෝග වල විධිවිධාන උල්ලංඝනය කරන වාහනයක රියදුරකු වරදක් කරනු ලබන අතර මහේස්ත්‍රාත්වරයකු ඉදිරිපිට දී පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසු -

(අ) පළමුවන වතාවට වරදකරු කරනු ලැබීමේ දී රුපියල් පන්දහස නොඉක්මවන දඩයකට ; සහ

(ආ) දෙවන වතාවට හෝ ඊට වැඩි වාර ගණනකට වරදකරු කරනු ලැබීමේ දී රුපියල් පනස් දහසක් නොඉක්මවන දඩයකට,

යටත් විය යුතුය.

12. මෙම නියෝගවල කාර්ය සඳහා -

"නම් කරන ලද ස්ථානය" යන්නෙන්, යම් වාහනයක රියදුරකු විසින් ගාස්තු ගෙවිය යුතු ජාතික මහා මාර්ගයට ප්‍රවේශ පත්‍රයක් ලබා නොගෙන ප්‍රවේශ වීමට අවසර දෙනු ලබන ස්ථානයක් අදහස් වන අතර එයට කැලණිය අන්තර් හුවමාරුව, පෑලියගොඩ අන්තර් හුවමාරුව, කටුනායක අන්තර් හුවමාරුව සහ කටුනායක (25.80 km) ඇතුළත්වේ.

"ඊ-ටැග් (E-tag) යන්නෙන් ඉලෙක්ට්‍රොනික ආකාරයෙන් ගාස්තු ගෙවීමේ මංතීරුව පසු කිරීමේ දී ඉලෙක්ට්‍රොනික ආකාරයෙන් ගාස්තු ගෙවීමේ කාර්ය සඳහා වාහනයේ ඉදිරිපස වීදුරුව මත ස්ථිරව සවිකරනු ලබන ඉලෙක්ට්‍රොනික උපාංගයක් අදහස් වේ.

"අයකැමි" යන්නෙන්, අන්තර් හුවමාරුවක හෝ නම් කරන ලද ස්ථානයක ගේට්ටු හසුරවනු ලබන නිලධරයෙකු අදහස් වේ;

"ගාස්තු ගෙවිය යුතු ජාතික මහා මාර්ගය" යන්නෙන්, කොළඹ - කටුනායක ගාස්තු ගෙවිය යුතු ජාතික මහා මාර්ගය අදහස් වේ.

13.2013 ඔක්තෝබර් මස 17 වන දිනැති අංක 1832/28 දරන *අති විශේෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද 2013 අංක 1 දරන ජාතික මංමාවත් (කොළඹ - කටුනායක ගාස්තු ගෙවිය යුතු ජාතික මහා මාර්ග) නියෝග, ඒ යටතේ කලින් සිදු කරන ලද කිසිවකට අගතිවිරහිතව මෙයින් පරිච්ඡින්න කරනු ලැබේ.

**උපලේඛනය**

***අ කොටස***




(3 වන නියෝගය)

කොළඹ - කටුනායක ගාස්තු ගෙවිය යුතු ජාතික මහා මාර්ගය (CKE)

1 වන වර්ගයට අයත් වාහන සඳහා ගෙවිය යුතු ගාස්තු ප්‍රමාණයන් (රු.)

| | අන්තර් හුවමාරුවන් අතර දුර ප්‍රමාණයන් කි.මී.14.58 | කි.මී. 7.56 | |
|---|---|---|---|
| | පෑලියගොඩ | ජා - ඇල | කටුනායක |
| පෑලියගොඩ | | | |
| ජා - ඇල | 200 | | |
| කටුනායක | 300 | 200 | |

1 වන වර්ගයට අයත් වාහනවලට පහත දේ ඇතුළත් විය යුතු යඃ-



| කාර් | |
|---|---|
|  | සියලුම කාර් |
|  | සියලුම ජීප් |
|  | සියලු සැලූන් ස්ටේෂන් වැගන් |
| ද්විත්ව කාර්ය වාහන | |
|  | සියලුම කැබ්රථ (තනි හා ද්විත්ව) |
|  | ආසන 9 ක් දක්වා වූ සියලු මගී වෑන් රථ |
|  | දළ බර කිලෝ ග්‍රෑම් 3500 දක්වා වූ බඩු ප්‍රවාහන වෑන් සහ ට්‍රක් රථ |
| සැහැල්ලු මෝටර් ලොරි | |
|  | ඇක්සල් 2 ක් සහ රෝද 4 ක් සහිත ලොරි සහ ට්‍රක් රථ |

2 වන වර්ගයට අයත් වාහන සඳහා ගෙවිය යුතු ගාස්තු ප්‍රමාණයන් (රු.)

| | අන්තර් හුවමාරුවන් අතර දුර ප්‍රමාණයන් කි.මී.14.58 කි.මී. 7.56 | | |
|---|---|---|---|
| | පැලියගොඩ | ජා - ඇල | කටුනායක |
| පැලියගොඩ | | | |
| ජා - ඇල | 350 | | |
| කටුනායක | 450 | 300 | |

2 වන වර්ගයට අයත් වාහන වලට පහත දේ ඇතුළත් විය යුතු යः-


සැහැල්ලු මෝටර් කෝච්

| | |
|---|---|
|  | ආසන 9 ට වැඩි මගී ප්‍රවාහන වෑන්රථ |
|  | ආසන 9 ත් 33 ත් අතර සියලු බස් රථ |

3 වන වර්ගයට අයත් වාහන සඳහා ගෙවිය යුතු ගාස්තු ප්‍රමාණයන් (රු.)

| | අන්තර් හුවමාරුවන් අතර දුර ප්‍රමාණයන් කි.මී.14.58 කි.මී. 7.56 | | |
|---|---|---|---|
| | පැලියගොඩ | ජා - ඇල | කටුනායක |
| පැලියගොඩ | | | |
| ජා - ඇල | 400 | | |
| කටුනායක | 600 | 300 | |


3 වන වර්ගයට අයත් වාහන වලට පහත දේ ඇතුළත් විය යුතු යඃ-

| මෝටර් කෝච් | |
|---|---|
|  | ආසන 33 ට වැඩි සියලු බස් රථ |
| සැහැල්ලු මෝටර් ලොරි | |
|  | ඇක්සල් 2 ක් සහ රෝද 6 ක් සහිත ලොරි සහ ට්‍රක් රථ |
| මෝටර් ලොරි | |
|  | (ඇක්සල් 3 ක් දක්වා ඇක්සල් සහිත) (දළ බර කිලෝ ග්‍රෑම් 17000 ට වැඩි GVW සහිත ලොරි රථ ට්‍රක් රථ) |

4 වන වර්ගයට අයත් වාහන සඳහා ගෙවිය යුතු ගාස්තු ප්‍රමාණයන් (රු.)

| | අන්තර් හුවමාරුවන් අතර දුර ප්‍රමාණයන් කි.මී.14.58 | කි.මී. 7.56 | |
|---|---|---|---|
| | පැලියගොඩ | ජා - ඇල | කටුනායක |
| පැලියගොඩ | | | |
| ජා - ඇල | 600 | | |
| කටුනායක | 800 | 300 | |

4 වන වර්ගයට අයත් වාහනවලට පහත දේ ඇතුළත් විය යුතු යඃ-

| බර මෝටර් කෝච් | |
|---|---|
|  | එකට ඈඳූ මෝටර් කෝච් දෙකක් සහිත බස් |
| බර මෝටර් ලොරි | |
|  | ඇක්සල් 4 ක් හෝ ඊට වැඩි සියලු රථ |

*ආ කොටස*

කොළඹ - කටුනායක ගාස්තු ගෙවිය යුතු ජාතික මහා මාර්ගය භාවිත කරන්නන් සඳහා වූ
ගාස්තු ගෙවීමෙන් බැහැර කර ඇති වාහන

1. ගාස්තු ගෙවිය යුතු ජාතික මහා මාර්ගය ඔස්සේ යම් තාක් දුරක් යම් අවස්ථාවක දී ගමන් කරනු ලබන ජනාධිපති ආරක්ෂක රථ පෙළට අයත් වන සියලු වාහන.

2. ගාස්තු ගෙවිය යුතු ජාතික මහා මාර්ගය ඔස්සේ යම් තාක්දුරක් යම් අවස්ථාවක දී ගමන් කරනු ලබන අගමැති ආරක්ෂක රථ පෙළට අයත් වන සියලු වාහන.

05 - 256

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.